තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

ප්‍රමිත 18 - වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී, වත්කම අයත් වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළයුතු වුවද, 2008 වර්ෂයේදී වාහන ප්‍රත්‍යාගණනය කිරීමේදී එක් වාහනයක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සේවකයන්ගේ දුරකථන බිල්පත් රු.31,299 ක් කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණු අතර එය ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ආයතනයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ වූ ප්‍රත්‍යාගණන සංචිතය රු.2,924,241 ක් විලම්භිත ආදායම් ගිණුමට බැර කර සංචිත ගිණුම කපාහැර තිබුණු අතර මෙම හේතුව නිසා ස්කන්ධය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ. තවද, ඉකුත් වර්ෂවලදී ද ප්‍රත්‍යාගණන සංචිතයෙන් රු.2,922,628 ක් මෙහෙයුම් සංචිතයට මාරු කර තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ගිණුම්කරණ පැකේජයක් හඳුන්වා දී ක්‍රියාත්මක කර ඇතත් එහි වටිනාකම 2011 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම් ගත කර නොතිබුණි. "ගිණුම්කරණ පැකේජයේ වැඩ අවසන් වී නොමැති බවත් වටිනාකම අමාත්‍යංශයෙන් දැනුම් දුන් පසු ගිණුම්ගත කරන බවත් " අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මධ්‍යස්ථාන 12 ක පාඨමාලා සඳහා උපකරණ ලබා ගැනීමට කොම්පන් සභාව විසින් රු3,360,399 ක් ලබා දී තබුණු අතර ඉන් රු1,945,811ක් වියදම් කර ඉතිරි රු.1,414,588 ක මුදල ලැබිය යුතු මුදල් හඳුනාගත හැකි වන පරිදි ගිණුම්වල සටහන් කර නොතිබුණි.

(ඉ) 2011 වර්ෂයේ මැයි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා බැංකුවට සෘජුවම තැන්පත් කරන ලද හා බැංකුවේ වැරදි ලෙස හඳුනාගන්නා ලද අවස්ථා 22 කට අදාල රු.90,621 ක මුදල් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.3 ලැබීමට ඇති ණය කාලය අනුව විශ්ලේෂණය

ලැබීමට ඇති ණය ශේෂය තුළ අවුරුදු 5 ක කාලයක් ඉක්මව රු.2,260 ක උත්සව අත්තිකාරම් ශේෂයක්ද, 2006 වර්ෂයේදී සේවයෙන් ඉවත් කරන ලද සේවකයෙකුගෙන් අයවිය යුතු රු.58,445 ක ණය ශේෂයක් සහ රු. 300 ක උත්සව අත්තිකාරම් ශේෂයක්ද , 2010 වර්ෂයේ සේවයෙන් පහ කරන ලද සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.146,267 ක අපදා ණය ශේෂයක්ද ඇතුලත්ව තිබුණි.

### 1.2.4 ලිඛිත සාක්ෂි නොවීම.

මූල්‍ය ප්‍රකාශනවල පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල ලිඛිත සාක්ෂි |
|---|---|---|
| ශිෂ්‍ය ප්‍රගති වාර්තා පොත් | 1,654,890 | ශේෂ සනාථ කිරීම්<br>උපලේඛන |
| ණයගැතියෝ | 27,528 | ශේෂ සනාථ කිරීම් |
| තැන්පතු හා ලැබිය යුතු ශේෂ | 783,529 | -එම- |
| ජාතික නිපුණතා සම්මත | - | තොග ලේඛන<br>උපලේඛන<br>සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ජ`නල් සටහන් | - | ජ`නල් සටහන්වලට අදාල සංලක්ෂය |
| මිලදී ගැනීම් | 1,199,986 | මිල ගණන් කැඳවීම |
| අළුත්වැඩියා හා වෙනත් වියදම් | 706,719 | ගෙවීම් වවුචර්වලට අදාල බිල්පත් |

1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරණ මුදල් පනත | |
| i. 8 (1) වගන්තිය | අයවැය ලේඛනය මාස 3 කට ප්‍රථම පාලක මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත්, අනුමැතිය ලබාගෙන තිබුණේ 2010 නොවැම්බර් 24 දිනදීය. |
| ii. 8 (3) වගන්තිය | අයවැය ලේඛණය සමග අයවැය ගත ලාභ ලාභ ගිණුමක් හෝ අයවැය ගිණුමක් සහ ශේෂ පත්‍රයක් සැකසිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| XXIV 4.5 වගන්තිය | සේවය හැරගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු 146,267 ක මුදල අයකර ගැනිමට නීතිමය ක්‍රියාමාර්ග හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි සංග්‍රහයේ | |
| i. අංක 386 (6) | ගෙවීම් සඳහා නිකුත් කරන ලද සියලුම චෙක්පත් රේඛනය කළ යුතු වුවත් එලෙස රේඛනය නොකර ගෙවීම් සිදු කර තිබුණු අවස්ථා 2 ක් විය. |
| ii. අංක 785 (4) | වාහන අළුත්වැඩියා කිරීම්වලදි රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව ආයතන වලින් මිල ගණන් කැඳවා තරගකාරී අවම මිලට සිදුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| iii. අංක 1646 | සෑම මාසයක් සඳහාම දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊට පසුව එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් වාහන 12 ක් වෙනුවෙන් වූ දෛනික ධාවන සටහන් 2009 සිට 2011 දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) අංක පීඒඩී/12 හා 2003 ජුනි 2 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 8.3.5 (අ) වගන්තිය. | චක්‍රලේඛ ප්‍රකාරව "සී" ශ්‍රේණියේ සංස්ථාවක නිල වාහන වෙන්කළ හැක්කේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී හා විධායක අධ්‍යක්ෂකවරයන් සඳහා පමණක් වුවද, ඊට පටහැනිව නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්වරයාට වාහනයක් වෙන්කර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේදි රු 165,600 බැගින් ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි. |
| (ඉ) අංක 22/99 හා 1999 ඔක්තෝබර් 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.3.1(iii) වගන්තිය. | චක්‍රලේඛය ප්‍රකාරව කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දිය යුතු වුවත් නිලධාරීන් 6 දෙනෙකුට වෙන්ව වාහන ලබා දී තිබුණි. |
| (ඊ) අංක 26/92 (1) හා 1994 අගෝස්තු 3 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛ ලිපිය. | වෙන්කල වාහන හැර ඉතිරි සියළුම වාහන වල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම පින්තාරු කළයුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (උ) කොම්ෂන් සභාවේ මුදල් උපදෙස් අංක 01 හි 10 වන වගන්තිය. | නිසි ඇස්තමේන්තුගත කිරීම් වලින් තොරව අත්තිකාරම් ලබාදීමත්, ප්‍රථමයෙන් ලබාගත් අත්තිකාරම් නොපියවන ලද නිලධාරීන්ට නැවත අත්තිකාරම් ලබාදීමත් සිදුකර තිබුණු අවස්ථා 10 ක් නිරීක්ෂණය විය. |
| (ඌ) 2008 ජුලි 28 දිනැති පීඒඩී 50 චක්‍රලේඛයේ 07 වැනි වගන්තිය | කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයීමේදී යාම් ඒම සඳහා උපරිම දුර කි. මී 50 ක් ලෙස දක්වා ඇතත් නිලධාරීන් දෙදෙනෙකු සඳහා එම දුර ඉක්මවා ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි. |

### 1.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයෙන් තහවුරු නොවූ ගනුදෙනු

කොම්ෂන් සභාව විසින් පාඨමාලා ප්‍රතීතනය (Accreditation) සඳහා මූල්‍යාධාර පිරිනැමීමේ දී අදාල ආයතන සමග ගිවිසුමකින් තොරව රාජ්‍ය ආයතන 3 කට රු.3,178,305 ක් ලබාදී තිබුණි.

1.2.7 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනයේ වාහන තිබියදී 2011 ඔක්තෝබර් 11 සිට 14 දින දක්වා පුහුණු මධ්‍යස්ථාන ප්‍රතීතනය සඳහා කුලී රථයක් ලබාගෙන රු.37,810 ක් ගෙවා තිබුණි.

(ආ) කොමිෂන් සභාවට එරෙහිව පවරා ඇති නඩුවකට වාර දෙකක් පෙනී සිටීම සඳහා රජයේ නීතිඥයකු ලබා නොගෙන වෙනත් පුද්ගලයෙකු ලබා ගැනීම වෙනුවෙන් රු.15,000 ක් ගෙවා තිබුණි.

(ඇ) කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සඳහා වාහන 2 ක් යෙදවීමට හැකියාව තිබියදී වෙන් වෙන්ව වාහන 5 ක් අනුයුක්ත කර තිබුණි. මෙම කාර්යය වාහන 2 කින් කළ හැකිව තිබියදී වාහන 4 ක් යෙදවීම නිසා රු.288,000 ක් නිෂ්ක්‍රියව වියදම් වන බව නිරීක්ෂණය විය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතුවලින් රු.1,575,803 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.812,916 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,388,719 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එය පහත සඳහන් පරිදි විග්‍රහ කළ හැකිය.

| ආදායම | හිතකර | අහිතකර | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ප්‍රදාන හා ආධාර ලැබීම් | 27,573,943 | - | |
| අනෙකුත් ආදායම් | 1,915,015 | - | |
| විලම්භිත ආදායම් | 2,051,884 | - | |
| | 31,540,842 | - | |
| | | | 31,540,842 |
| වියදම් | - | 20,243,236 | |
| මෙහෙයුම් වියදම් | - | 3,848,251 | |
| පරිපාලන වියදම් | - | 2,453,090 | |
| වෙනත් වියදම් | - | 1,230,852 | |
| ක්ෂය | - | 1,376,694 | |
| ව්‍යාපෘති වියදම් | - | 29,152,123 | 29,152,123 |
| අතිරික්තයේ ශුද්ධ වැඩිවීම | | | 2,388,719 |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### 3.1.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම 2011 ජූලි 27 නැවත සංශෝධනය කර තිබුණු අතර, ඊට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මෙලෙස සංශෝධිත සැලැස්මේ වූ ඉලක්කයන් ළඟා කර ගැනීමට කොමිෂන් සභාව සමත් වී නොතිබුණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සැලසුම් හා පර්යේෂණ අංශය

සමාලෝචිත වර්ෂයේදි පිඩාවට පත් වූ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව සපයන ආයතනවල පාඨමාලා 16 ක් වෙනුවෙන් මූල්‍යාධාර සැපයීම සඳහා රුපියල් මිලියන 2 ක් වෙන්කර තිබුණද, මූල්‍යාධාර සපයා තිබුණේ පාඨමාලා 10 ක් සඳහා රු.1,993,000 ක් පමණි.

(ආ) පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශය

(i) සමාලෝචිත වර්ෂය තුළ පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| පුහුණුව සපයන ආයතනය | ප්‍රතීතනය සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාව | ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය කරනු ලැබූ පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය කරන ලද පාඨමාලා ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ❖ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | 49 | 21 | 14 | 67% |
| ❖ ජාතික තරුණ සේවා සභාව | 44 | 20 | - | 0% |
| ❖ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 76 | 85 | 63 | 74% |
| ❖ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 106 | 131 | 93 | 71% |
| ❖ වෙනත් රාජ්‍ය ආයතන | 15 | 07 | 04 | 57% |
| ❖ පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 88 | 177 | 52 | 29% |

නිරීක්ෂණයන් පහත පරිදි වේ.

* රාජ්‍ය අංශය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශවල ප්‍රතීතන (Accreditation) ඇගයීම් හා ප්‍රතීතනයන් (Accreditation) අපේක්ෂිත ඉලක්කයට වඩා පිරිහීමක් පෙන්නුම්කර තිබුණු අතර පුහුණුව සපයන ආයතන වශයෙන් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සමග සංසන්දනය කිරීමේදී ප්‍රතීතනය කිරීමේ ප්‍රවණතාවය පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය තුල ප්‍රතීතනය අලුත් කිරීම සඳහා පුහුණුව සපයන ආයතන වශයෙන් අයදුම්පත් ලැබීම, ඇගයීම් කිරීම හා ප්‍රතීතනය අළුත් කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පුහුණුව සපයන ආයතන | ප්‍රතීතනය සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාව | ඇගයීම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය අලුත් කරන ලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රතීතනය අලුත් කරන ලද පාඨමාලා සංඛ්‍යාව ඇගයීම් කරන ලද සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ❖ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය | 06 | 11 | 06 | 55 |
| ❖ ජාතික තරුණ සේවා සභාව | - | 04 | - | 0 |
| ❖ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 16 | 21 | 16 | 76 |
| ❖ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 21 | 41 | 31 | 76 |
| ❖ වෙනත් රාජ්‍ය ආයතන | 01 | - | - | - |
| ❖ පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 23 | 30 | 27 | 90 |

(ඇ) ජාතික වෘත්තීය සුදුසුකම් අංශය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුල ජාතික නිපුණතා සම්මත පිළිබඳ වැඩසටහන් 02 ක් හා රුස්වීම් 02 ක් පැවැත්වීමට හා ජාතික නිපුණතා සම්මත 10 ක පිටපත් 100 ක් සමග සැකසීමට ඉලක්ක කිරීම යන කාර්යයන් සිදුකර නොතිබුණි.

(ii) ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය ව්‍යාප්ත කිරීම හා පවත්වාගෙන යාම සඳහා ඉලක්ක කරා ළඟාවීමට නොහැකි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | ඉලක්කගත තත්ත්වය | තථ්‍ය තත්ත්වය | ඉලක්ක කරා ලඟා නොවීම් |
|---|---|---|---|
| ❖ ජාතික වෘත්තීය සුදුසුකම් 5 හා 6 මට්ටමේ ජාතික නිපුණතා සම්මත සංවර්ධනය | 2 | - | නිම කර නැත |
| ❖ ජාතික වෘත්තීය සුදුසුකම් 1 - 4 මට්ටමේ ජාතික නිපුණතා සම්මත සංවර්ධනය | 5 | 2 | 3 |
| ❖ අධ්‍යයන පටිපාටි / විෂයමාලා හඳුන්වා දීම | 7 | 6 | 1 |
| ❖ ඇගයීම්කරුවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 150 | 76 | 74 |
| ❖ නිපුණතා පාදක ඇගයීම් සිදුකිරීම් හා පසු විපරම් කිරීම | 8 | 2 | 6 |
| ❖ නිපුණතා පාදක ඇගයීම්වල සංගතභාවය තහවුරු කිරීම සඳහා | | | |
| - විගණනයන් | 24 | 10 | 14 |
| - අහඹු විගණනයන් | 12 | 7 | 5 |

(ඈ) (i) ශ්‍රී ලංකාවේ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා විශ්වාසනීය ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම හා පවත්වා ගෙන යාම සඳහා වූ ඉලක්ක කරා ලඟාවීම් පහත වගුවේ දැක්වේ.

| විස්තරය | ඉලක්කගත තත්ත්වය | තථ්‍ය තත්ත්වය | ඉලක්ක කරා ලඟා නොවීම් |
|---|---|---|---|
| ❖ පුහුණු ආයතන ලියාපදිංචි කිරීම් යටතේ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම | 2 | 0 | 2 |
| ❖ පාඨමාලා ඇගයීම් කිරීම - රාජ්‍ය අංශය | 92 | 77 | 15 |
| - පෞද්ගලික අංශය | 55 | 30 | 25 |
| ❖ පාඨමාලා ලියාපදිංචිය අලුත් කිරීම - රාජ්‍ය අංශය | 92 | 51 | 41 |
| - පෞද්ගලික අංශය | 55 | 27 | 28 |
| ❖ පුහුණු වැඩසටහන් පැවැත්වීම - උපදේශකවරුන් සඳහා | 5 | 0 | 5 |
| - ඇගයීම්කරුවන් සඳහා | 1 | 0 | 1 |
| - පාඨමාලා ප්‍රතිනනය සඳහා | 1 | 0 | 1 |

(ii) ශ්‍රී ලංකාවේ සියලුම වෘත්තීය පුහුණු ආයතන යටතේ ලියාපදිංචි නොවූ පුහුණු ආයතනවල ලැයිස්තුවක් හඳුනා ගැනීමට සැලසුම් කර තිබුණත් කාර්යසාධන වාර්තාව අනුව එලෙස හඳුනා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍යාධාර පිරිනැමීම.
------------------------

(i) සමාලෝචිත වර්ෂයේදි රාජ්‍ය අංශයේ ආයතන සඳහා රු.16,988,909 ක මූල්‍යාධාර පිරිනමා තිබුණු අතර එම ආයතන විසන් උපකරණ මිලදී ගැනීම් හා පාඨමාලා ප්‍රතීතන කටයුතු වර්ෂය තුළ සිදු කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. තවද උපකරණ මිලදී ගෙන ඇති අවස්ථාවල ඉතිරි වූ මුදල් දින 14 ක් ඇතුළත කොමිෂන් සභාවට ලබාදිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන සඳහා රු.6,876,569 ක මූල්‍යාධාර ලබාදී තිබුණු අතර මෙම මූල්‍යාධාර ලබාදුන් ආයතනවලින් පාඨමාලා ප්‍රතීතන කටයුතු , උපකරණ මිලදී ගැනීම හා ගිවිසුමේ සඳහන් අනෙකුත් කොන්දේසි අනුව කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ආයතන | මුදල<br>රු. | වෙනත් |
|---|---|---|
| ❖ S.W.H වෘත්තීය පුහුණු ආයතනය - අනුරාධපුරය | 201,892 | NVQ 3 ලෙස දක්වා තිබුණද NVQ 2 වීම හා ප්‍රතීතනය නවතා තිබීම |
| ❖ මියානි තාක්ෂණ ආයතනය - මඩකලපුව | 276,150 | ප්‍රතීතනය නොකිරීම |
| ❖ දොන් බෝස්කො කාර්මික ආයතනය - මහනුවර | 111,371 | ප්‍රතීතනයට ඇගයීම් නොකිරීම |
| ❖ ශාන්ත ඇන්තෝනි තාක්ෂණ ආයතනය | 173,481 | ප්‍රතීතනය 2011 ජනවාරි අවසන් වී ඇතත් නැවත ලබා නොගැනීම |
| ❖ ටෙක් විතානික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 53,200 | පසු විපරම් කටයුතු සිදු නොකිරීම |
| ❖ ඉලෙක්ට්‍රොනික් කාර්මික පුහුණු ආයතනය - මීගමුව | 28,525 | වගකීම් සහතික ඉදිරිපත් නොකිරීම |
| | 844,619 | |

(iii) 2006 සිට 2010 වර්ෂය දක්වා රාජ්‍ය අංශයට පාඨමාලා ප්‍රතීතනය සඳහා ලබාදෙන ලද රු.19,213,747 ක් වූ මූල්‍යාධාරවලට අදාළ පාඨමාලා 2012 වර්ෂයේ මාර්තු වනවිටත් ප්‍රතීතනය කර නොතිබුණි. පෞද්ගලික අංශයේ පුහුණු

ආයතන 3ක් වෙත රු.562,743 ක මූල්‍යාධාර ලබාදී තිබුණද එම පාඨමාලා 2012 වර්ෂය වන විට ක්‍රියාත්මක නොවන බවද නිරීක්ෂණය විය.

(iv) රාජ්‍ය අංශයේ පුහුණු ආයතන 2 ක් වෙත ලබාදුන් රු.1,226,450 කින් අදාල උපකරණ මිලදීගෙන නොතිබුණි.

(v) 2010 වර්ෂයේදී රු.497,964 ක් ගෙවීම් කර ඇති රාජ්‍ය ආයතන 2 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන බව 2011 මැයි 23 දින වාර්තා කර ඇතත් මෙතෙක් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා රු.358,151 ක් වියදම් කර තිබුණි. සේවකයන් 4 දෙනෙකු සදහා රු.75,300 ක් වැය කර තනතුරට අදාල නොවන පුහුණුවීම් ලබාදීම, සේවකයින් සමග ගිවිසුමකට නොඑළඹීම, පාඨමාලා අවසන් කළ බවට සාධක නොවීම වැනි කරුණු නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රවාහන ඇණිය පරීක්ෂාව

කොමිෂන් සභාව සතුව වාහන 12 ක් පැවති අතර රියදුරන් 6 ක් පමණක් සේවයේ යොදවාගෙන තිබුණි. ඒ අනුව වාහන 6 ක් පූර්ණ කාලීනව සේවයේ යොදවා නොගෙන නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) තෘතියික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති ආධාර (TEDP Grant)

මෙම ආධාර යටතේ ප්‍රතීතනයලත් පුහුණු සපයන්නන්ගේ සංගමය විසින් 2011 වර්ෂයේදී ජාතික වෘත්තීය සුදුසුකම් දැනුවත් කිරීමේ (NVQ Awarness Programme) වැඩසටහන් 05 ක් ද , ප්‍රදර්ශනයක් හා වැඩමුළුවක් පවත්වා තිබුණු අතර මේ සදහා රු.623,566 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධව රු.220,000 ක් වැයකර පැවැත්වූ වැඩමුළුව පිළිබඳ නියැදි පරීක්ෂාවේදී සහභාගිවන්නන් පිළිබඳව ඇස්තමේන්තු කර නොතිබීම, මුද්‍රණය කරන ලද ආරාධනා පත්‍ර බෙදානොහැරීම, නියමිත කාල සටහනට අනුකූලව වැඩ සටහන නිම නොකිරීම නිසා රු.53,050 ක අතිරේක වියදමක් දැරීම, ටිකට් පත් ආදායම ගිණුම් ගත නොකිරීම වැනි කරුණු නිරීක්ෂණය වූ අතර වෙනත් වැඩසටහනකට දෙන ලද රු.36,000 ක අත්තිකාරම් මුදල්ද පියවා නොතිබුණි.

(ඉ) 2009 ,2010 හා 2011 වර්ෂ තුළ රු.1,198,000 ක් , 64,000 ක් හා 1,366,000 ක් වැය කර පර්යේෂණ 5 ක් හා 6 ක් කර තිබුණද, පර්යේෂණ අවශ්‍යතා කොමිෂන් සභාව විසින් තීරණය නොකිරීම, පර්යේෂණ ප්‍රවීනත්වයක් ඇති පුද්ගලයන් නොයෙදීම, පර්යේෂණ වාර්තාවන් කොමිෂන් සභාවේ අරමුණු කරා ළගා වීම සඳහා ක්‍රියාත්මක

නොකිරීම, කාර්මික හා වෘත්තීය පුහුණු ආයතන වෙත භාරදෙන පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් නොකිරීම වැනි කරුණු හේතුවෙන් කොම්පත් සභා පනතේ 3.1 වගන්තියේ අරමුණු ඉටු වී තිබේද යන්න සැක සහිත විය.

(ඊ) ගිණුම්කරණ මෘදුකාංගය මිලදී ගැනීම

2006 වර්ෂයේ කොම්පත් සභාව රු.345,000 ක් වටිනා ගිණුම්කරණ මෘදුකාංගයක් ලබා ගැනීමට ගිවිසුමකට එළඹී ඒ සඳහා රු.120,000 ක් අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර ගිවිසුම අනුව ගෙවිය යුතු අත්තිකාරමට වඩා රු.60,000 ක් ගෙවා තිබුණ.

3.3 අරමුදල් ඌන උපයෝජනය

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන බැංකු ජංගම ගිණුම් දෙකෙහි සැලකිය යුතු මුදල් ශේෂයන් නිෂ්ක්‍රීයව රඳවා තිබුණු බව නිරීක්ෂණය විය. එකී බැංකු ගිණුම් දෙකෙහි රඳවා තිබුණු මුදල්වල සාමාන්‍ය මාසික වියදම රු.5,111,455 ක් හා රු.7,129,730 ක් විය. ඒ අනුව අතිරික්ත මුදල් ජංගම ගිණුම්වල නොතබා ආයෝජනය කර පොලී ආදායම් උපයා ගැනීමට තිබුණු විකල්පයන් කෙරෙහි කොම්පත් සභාවේ අවධානය යොමුකර නොතිබුණි. එක් බැංකු ගිණුමක මාසය ආරම්භයේ පැවති ශේෂය සාමාන්‍ය මාසික වියදම මෙන් 4 ගුණයේ සිට 73 ගුණය අතර පරාසයක වූ අවස්ථා විය.

(ආ) 2005 වර්ෂයේ ජනවාරි 06 දින වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශයට නිදහස් කර ඇති 51-9656 දරන රථය 2011 මාර්තු 28 දින සිට 2012 මාර්තු 30 දින වන විටත් ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ අනාරක්ෂිතව ගාල්කර තිබුණු අතර මෙම වාහනය අපහරණය කිරීම සඳහා මෙතෙක් කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණු අතර, එකී සංශෝධිත අයවැය ලේඛනයේ ඇතුලත් සංඛ්‍යාවන් සහ තථ්‍ය සංඛ්‍යාවන් අතර වියදම්වල 7% සිට 85% පරාසයක හා ආදායම්වල 37% සිට 237% පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය හා බැංකු
(ඇ) අභ්‍යන්තර පාලනය
(ඈ) වාහන උපයෝජනය
(ඉ) සේවක මණ්ඩල කළමනාකරණය
(ඊ) පර්යේෂණ පැවැත්වීම